# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 722/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 27/04/2024 පැය 1730

## මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරින්ගේ විනය පරීක්ෂණ ප්‍රමාදවීම සම්බන්ධයෙන් විසඳුම් සහ නිර්දේශ ඉදිරිපත් කරමින් සකස් කරන ලද කමිටු වාර්තාව පොලිස්පතිතුමා වෙත භාර දීම - පොලිස් මූලස්ථානය.**

පොලිස් නිලධාරීන්ට එරෙහි විනය කාර්ය පටිපාටියට අදාළ පරීක්ෂණ සඳහා දීර්ඝ කාලයක් ගතවීම නිසා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, දීමනා, සහ උසස් වීම් ප්‍රමාදවීම වැනි පරිපාලන ගැටළු සම්බන්ධයෙන් සොයා බලා ඊට අදාළ විසඳුම් යෝජනා කිරීම සඳහා නැගෙනහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතාගේ ප්‍රධානත්වයෙන් පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් පත් කරන ලදී.

**එම කමිටුවට විනය හා කල්ක්‍රියා හා නීති දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති නීතිඥ රුවන් ගුණසේකර මහතා , නියෝජ්‍ය පොලිස්පති ජාතික පොලිස් අභ්‍යාස ආයතනය නීතිඥ ජාලිය සේනාරත්න මහතා , මානව සම්පත් කලමනාකරණ කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩබ්.පී.ජේ. සේනාධීර මහතා සහ විනය හා කල්ක්‍රියා කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සිල්වා මහතා ඇතුලත් වේ.**

කමිටුව විසින් යෝජනා කරන ලද විනය පටිපාටිය කඩිනම් කිරීම සහ පරිපාලන ගැටළු වලට විසඳුම් සහ නිර්දේශ ඉදිරිපත් කරමින් සකස් කරන ලද කමිටු වාර්තාව 2024.04.26 වන දින කමිටු සභාපති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා විසින් පොලිස් මූලස්ථානයේදී පොලිස්පතිතුමා වෙත පිළිගන්වන ලදී.

එම නිර්දේශයන් ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, මෙම අවස්ථාවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) නිලන්ත ජයවර්ධන මහතා සහ කමිටු සාමාජිකයින් ද සහභාගී විය.

මේ අවස්ථාවට අදාල ඡායාරූප මේ සමඟ එවමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**